# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021.05.17

පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

<u>පොලිස් භාරයේ සිටියදී මියයාම සම්බන්ධවයි.</u>

ධර්මකීර්ති තාරක පෙරේරා විජේසේකර නොහොත් කොස්ගොඩ තාරක සහ මාබුලගේ දිනිත් මෙලාන් මාබුල නොහොත් ඌරුජුවා යන අයවලුන් 2021.05.13 සහ 2021.05.11 යන දිනවල පොලිස් භාරයේ සිටියදී වෙඩි වැදී මියගොස් ඇත.

මීට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි යොමු වී ඇති අතර, එම පැමිණිලි HRC/1216/21 සහ HRC/1176/21 යටතේ ලියාපදිංචි වී ඇත.

පොලිස් භාරයේ සිටින සැකකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම පොලිස් දෙපාර්තමේන්තුවේ වගකීමක් වන අතර, පොලිස් දෙපාර්තමේන්තුවේ නියෝග වල මෙන්ම ගරු ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු වල ද එම කරුණ අවධාරණය කර ඇත.

ආසන්න දින කිහිපයක් තුළ මෙවැනි සිදුවීම් වාර්තා වීම තුළින් රට තුළ නීතියේ ආධිපත්‍ය පිළිබඳ බරපතල ගැටළුකාරී තත්වයක් ගොඩනැඟෙන බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විශ්වාසයයි.

කොමිෂන් සභාවට ලැබී ඇති පැමිණිලි විමර්ශනය කිරීමේ ආරම්භක පියවරක් වශයෙන් ඔබ දෙපාර්තමේන්තුව මෙම සිදුවීම පිළිබඳව සිදු කරන ලද පරීක්ෂණය පිළිබඳ පූර්ණ වාර්තාවක් කැඳවීමට තීරණය කර ඇත.

එබැවින්, ඔබ දෙපාර්තමේන්තුව තුළ සිදුකරන ලද පරීක්ෂණ වාර්තාව 2021.05.30 දිනට පෙර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙසට මෙයින් ඔබ වෙත දන්වා සිටිමි.

මෙම දැනුම්දීම කරනුයේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ බලතල ප්‍රකාරවය.

ආචාර්ය ජගත් බාලසූරිය
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ස/-


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com